සැ. යු. - මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2021 වර්ෂය සඳහා ගාල්ල-බලපිටිය දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,217 - 2021 පෙබරවාරි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2021.02.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 390 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - (i) වර්ල්ඩ් ලයිෆ් ලයින් යෝගා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 පෙබරවාරි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 පෙබරවාරි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**
**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 මාර්තු මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 මාර්තු මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## අකුරණ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හා අකුරණ ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන මංමාවත්, පාරවල් සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ වූ පියවර අනුගමනය කිරීම සම්බන්ධයෙන් අවසර ඇති කාලයක් වශයෙන් 2019.06.01 සිට 2022.06.01 දක්වා වූ කාලය සැලකීමට 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා අවසර දී ඇති බැවින්ද,


ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV ආ කොටස 2020.08.07 දින දරන *ගැසට් පත්‍රයේ* පල කරන්නට යෙදුනාවූ ඊට අදාළ වූ නිවේදනය යටතේ උපලේඛනගතව විස්තර කරනු ලැබූ, එසේම මෙහි පහත උපලේඛනයේද විස්තර කරන්නා වූ මංමාවත්, පාර අකුරණ ප්‍රාදේශීය සභාව සතු අකුරණ ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලැබූ පාරක් බව මෙයින් නිවේදනය කරමු.

අයි. එම්. ඉස්තිහාර්,
සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2021 පෙබරවාරි මස,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

**ඉහත කී උපලේඛනය**

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *දිග* | *පළල* | *මායිම්* |
|---|---|---|---|---|
| 01 | අකුරණ තෙලඹුගහවත්ත ඩ්‍රීම් විලේජ් මාර්ගය | අඩි 970 | අඩි 08 | ඩබ්. එම්. ජී. කේ. විජේසිංහ, බලයලත් මිනින්දෝරු විසින් මැන සකස් කරන ලද 2020.02.17 දිනැති අංක 2354 දරන පිඹුරේ සඳහන් පරිදි<br><br>දකුණු පස<br><br>එච්. එම්. රම්ෂා මියගේ ඉඩමට (ඔප්පු අංක 440) එස්. එම්. එම්. මර්සූක් හා වෙනත් අයගේ ඉඩමට (ඔප්පු අංක 441) එච්. එම්. එම්. හරීස් (ඔප්පු අංක 8781) එස්. එම්. ෂවාහිරා (ඔප්පු අංක 14663) ඒ. එච්. නවුසාඩ් මොහොමඩ් (ඔප්පු අංක 3477) එස්. ඒ. ෆරීඩ් හා වෙනත් (ඔප්පු අංක ඉදිරිපත් ව නැති) එස්. එච්. එෆ්. නෂිරා (ඔප්පු අංක 3246) එස්. ඒ. ජමීලා උම්මා (ඔප්පු අංක 3260) එච්. එම්. එම්. ශ්‍යාමන් (ඔප්පු අංක 1202) එම්. එන්. එම්. ඉර්ෆාන් (ඔප්පු අංක 517)<br><br>වම්පස<br><br>බී. ඒ. සී. එම්. නෂීර් (ඔප්පු අංක 2453) එම්. ආර්. ෆයදෝස් (ඔප්පු අංක ඉදිරිපත් ව නැති) එම්. එස්. එස්. රස්මිලා (ඔප්පු අංක ඉදිරිපත් ව නැති ) එච්. එම්. එම්. හනීෆා (ඔප්පු අංක 1039) එච්. එම්. එස්. ෆතිලා (ඔප්පු අංක 1039) එම්. එස්. එම්. ෂියාන් (ඔප්පු අංක 1039) එම්. ආර්. රම්ෂාන් මොහොමඩ් (ඔප්පු අංක 1039) එම්. එච්. එම්. ඉසඩීන් (ඔප්පු අංක ඉදිරිපත් ව නැති) ඒ. එච්. නවුසාඩ් මොහොමඩ් (ඔප්පු අංක 3477) එම්. ඒ. එම්. අමාන් (ඔප්පු අංක 5737) හා එම්. කේ. එස්. ජයිසා (ඔප්පු අංක 3442) ඉඩමට අයත් වන මායිම් වේ. |




| Lot No | Extent Hec. | A | R | P | Remarks |
|---|---|---|---|---|---|
| 1 | 0.0766 | 0 | 0 | 30.29 | proposed 8 Ft. wide access |
| 2 | 0.0016 | 0 | 0 | 00.64 | part of proposed 8 Ft. wide access Land claimed by H.M.Rameesha |
| Total | 0.0782 | 0 | 0 | 30.93 | |


W.M.G.K. Wijesinghe
Registered Licensed Surveyor, Leveller
& Court Commissioner
(Land Survey Council Regd. No.19921656)
No. 23/A/1, Kahalla,
Katugastota.
Tele. 081-2499272
071-4455907
077-6777736

**PLAN NO : 2354**
Section 2 of 2 sections.

Reference
St : Stake
BW : Boundary Wall
RW : Retaining Wall
P : Permanent building
CP : Concrete Post
TP : Telephone Post
EP : Electricity Post

Scale 1:500

— PLAN —
— of —
Two allotments of proposed 8 Ft. wide access called as Dream Village Road Situated at Thelambugahawatta in Thelambugahawatta G.N. Division of Akurana Pradeshiya Sabha Limits of Udagampaha Korale of Akurana D.S. Division
**KANDY DISTRICT**
**CENTRAL PROVINCE**




සත්‍ය පිටපතකි.

Issued on 19.02.2020

Surveyed on 17.02.2020
The boundaries surveyed as shown by Mr.R.G.M.Thilakaratne, Supdt. of works, Akurana Pradeshiya Sabha & land claiments.

02-614

## මහරගම නගර සභාව

### නගර සභා ආඥාපනත යටතේ (255 වන අධිකාරිය) 50 හා 52 වන වගන්තිය ප්‍රකාර කරනු ලබන දන්වීම

නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරියේ 50 හා 52 වන වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

*ටිරාජ් ලක්රුවන් පියරත්න,*
සභාපති,
මහරගම නගර සභාව.

**ඉහත කී උපලේඛනය**

| *අනු. අංකය* | *සැලසුම් අංකය දිනය හා මිනින්දෝරු මහතාගේ නම* | *මාර්ගයේ නම* | *ග්‍රාම සේවා වසම* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* |
|---|---|---|---|---|---|---|---|
| 01 | සැලසුම්පත් අංකය : 3081<br>ඒ. ජී. ප්‍රනාන්දු මහතා | චන්ද්‍රවිමල මාවත අතුරු මාර්ගය | 525 තලපත්පිටිය | මී. 50.5 | මී. 3 | චන්ද්‍රවිමල මාවත | ව. අ. 245/6 B |
| 02 | සැලසුම්පත් අංකය 2194 එච්. ඒ. ඩී. ප්‍රේමරත්න මහතා දිනය : 2014.05.02 | පන්නිපිටිය දෙල්-ගහවත්ත පාරේ වරිපනම් අංක 536/30 නිවසින් පටන්ගෙන අංක 536/30 ඩී දක්වා අතුරු මාර්ගය | 531 A පන්නිපිටිය දකුණ | අඩි 250 | අඩි 20 - අඩි 15 | වරිපනම් අංක 536/30 | වරිපනම් අංක 536/30 ඩී |
| | සැලසුම්පත් අංකය 6938 එච්. ඒ. ඩී. ප්‍රේමරත්න මහතා දිනය : 2014 | එම | | එම | එම | එම | එම |
| 03 | සැලසුම් අංකය : 2074<br>ඒ. ඊ. විජේසූරිය මහතා | රජමහා විහාර පාර වරිපනම් අංක 283 අසල අතුරු මාර්ගය | 523 මිරිහාන උතුර | අඩි 330 | අඩි 15 | වරිපනම් අංකය 283 | වරිපනම් අංකය 283/7 |

02-652

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.